# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

**ශාස්ත්‍රපති සමාජවිද්‍යාව පශ්චාද් උපාධි එක් අවුරුදු පාඨමාලාව**
**Master of Sociology – One Year Programme**

සමාජවිද්‍යා අධ්‍යයනාංශය මගින් මෙහෙයවනු ලබන ඉහත පාඨමාලාව සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර 2022 **සැප්තැම්බර් 09** දින දක්වා කැඳවනු ලැබේ.

### අවශ්‍ය සුදුසුකම්

(1) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සමාජවිද්‍යාව විශේෂ උපාධිය හෝ
(2) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජවිද්‍යාව විෂය සහිත ව ලබාගත් සාමාන්‍ය උපාධිය හෝ
(3) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑ ම උපාධියක් ලබා තිබීම හා අවුරුදු තුනකට නොඅඩු අදාළ රැකියා ක්ෂේත්‍රයක පළපුරුද්ද හෝ පර්යේෂණ සුදුසුකම්වලින් සමන්විත වීම

**පාඨමාලාවේ දේශන** - ඉරිදා පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ දී පැවැත්වේ. (ක්ෂේත්‍ර අධ්‍යයන ද ඇතුළත් වේ).
**මාධ්‍යය** - සිංහල
මෙම උපාධි පාඨමාලාව සමත් වීම සමාජවිද්‍යාව දර්ශනපති / දර්ශනසූරී උපාධි හැදෑරීමට සුදුසුකමක් වනු ඇත.

### පාඨමාලා ගාස්තුව

රුපියල් එක් ලක්ෂ විසි දහසකි (රුපියල් 120,000.00). (ලියාපදිංචි ගාස්තු, පුස්තකාල ගාස්තු, විභාග ගාස්තු සහ නැවත ගෙවන පුස්තකාල ගාස්තු ද එයට ඇතුළත් වේ).

මුළු මුදල වාරික දෙකකින් ගෙවිය හැකි ය. (පළමු වාරිකය ලෙස රුපියල් 80,000 මුදලක් ලියාපදිංචි වන අවස්ථාවේ ගෙවිය යුතු ය. ඉතිරි මුදල ලියාපදිංචි දිනයේ සිට මාස 4ක කාලයක් තුළ ගෙවිය යුතු ය).

### අයදුම් කිරීම

පාඨමාලාවට අයදුම් කිරීමට සහ සියලු විස්තර සඳහා **www.graduate.sjp.ac.lk** වෙබ් අඩවියට පිවිසෙන්න. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත්‍රය සම්පූර්ණ කර එය බාගත කරගන්න. ඕනෑ ම මහජන බැංකු ශාඛාවක ගිණුම් අංක 053010006830 ට රුපියල් දෙදහසක් (රුපියල් 2000.00) බැරකොට ලබාගත් රිසිට් පත, බාගත කරගත් අයදුම්පත්‍රය ද සමඟ අදාළ සහතික පත්‍රවල සහතික කරගත් පිටපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සළස්වන්න.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ

**පාඨමාලාව සඳහා විමසීම්**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මයුර සමරකෝන්
පාඨමාලා සමායෝජක / ශාස්ත්‍රපති සමාජවිද්‍යාව
**011 280 2207 / 071 416 6083 / 071 355 4819**

නිමාලි කෞශල්‍යා
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
**011 288 1558**

ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය